**නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - (අදියර 01) - 2023**

---

නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (අදියර 01) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රංශ සංවර්ධන ආයතනය (Agence Francaise De Development) අතර 2016 ජුනි 01 දින එළඹි අංක සීඑල්කේ 1013 – 01 කේ දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 (එච්) වගන්තිය සහ 2016 මාර්තු 16 දින එළඹි අංක සීඑල්කේ 1013-02 එල් දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය පහසුකම් හා මූල්‍ය ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.
ව්‍යාපෘතියේ අරමුණු වන්නේ අප ජලය රැස්කිරීම හා පිරිපහදු පද්ධති ව්‍යාප්ත කිරීම සහ මීගමුව මහ නගර සභා බල ප්‍රදේශයේ 73,000 ක් වූ ජනතාවට සනීපාරක්ෂක සේවා ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථා වැඩි දියුණු කිරීම, ජල හා සනීපාරක්ෂ අංශයේ ව්‍යුහය වැඩි දියුණු කිරීම හා විශ්ලේෂණය කිරීම, දරිද්‍රතාව පිටු දැකීම සඳහා අවැසි දිළිඳු හිතකාමී ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම මගින් වරප්‍රසාද නොලත් නිවැසියන්ට සේවා ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථා සැලසීම සහ වෙරළාශ්‍රිත හා නාවික පරිසර පද්ධති ආරක්ෂාව සහ ජෛව විවිධත්ව නඩත්තුව සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම වේ. සැලසුම් සහ අධීක්ෂණ උපදේශන, මීගමුවේ සනීපාරක්ෂාව, කළමනාකරණ සහය උපදේශන යන අංග 03 යටතේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,739.81 කට සමාන යූරෝ මිලියන 107.70 ක් වන අතර ඉන් රු.මිලියන 13,224 කට සමාන යූරෝ මිලියන 76 ක් ණයක් වශයෙන් මූල්‍යායනය කිරීමටත්, රු.මිලියන 991.81 කට සමාන යූරෝ මිලියන 5.70 ක් මුදලක් ප්‍රදානයක් ලෙස මූල්‍යකරණය කිරීමට ඒජන්සි ෆ්‍රැන්කේස් ඩි ඩිවලොප්මන්ට් විසින් එකඟ විය. ඉතිරි යූරෝ මිලියන 26 කට සමාන රු.මිලියන 4524 ක ප්‍රමාණය ශ්‍රී ලංකා රජය විසින් සැපයීමටත් නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජුනි 01 දින ආරම්භ කරන ලද අතර 2022 ජුනි 30 වන විට නිම කිරීමට නියමිතය. ණය දෙන ආයතනය මුදල් ලබා දීම නවතා දැමීම හේතුවෙන් 2023 අප්‍රේල් 30 වන විට ව්‍යාපෘතිය තාවකාලිකව නතර කර තිබුණි.

## 1.3 මතය

මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මගින් 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය හා සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්ය සාධනය

### 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| | ව්‍යාපෘති සංරචකය | ක්‍රියාකාරකම | 2023 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රසම්පාදනයේ අපේක්ෂිත භෞතික කාර්ය සාධනය ප්‍රතිශතය | ප්‍රසම්පාදනය විසින් ළඟා කරගෙන ඇති කාර්ය සාධනය ප්‍රතිශතය | | | |
| (අ) | මලාපවහන අංශයේ තාක්ෂණික සහාය සහ ධාරිතා වර්ධනය. | කළමනාකරණ සහාය උපදේශනය | 100 | 61 | කළමනාකරණ සහාය උපදේශන කොන්ත්‍රාත්තුට අදාලව දුර්වල කාර්ය සාධනයක් අත්පත් කරගෙන තිබුණි. | ව්‍යාපෘතිය අත්හිටුවීම හේතුවෙන්, මෙම කොන්ත්‍රාත්තු යෙදවුම් තවදුරටත් අවශ්‍ය නොවනු ඇත. | ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ගාල්ල/උනවටුන සහ කැලණිය/පෑලියගොඩ මලාපවහන යටිතල පහසුකම් සඳහා අධ්‍යයනය සහ ටෙන්ඩර් ලේඛන | නිර්මාණ සහ අධීක්ෂණ උපදේශනය | 100 | 52 | මීගමුව, ගාල්ල/උනවටුන සහ කැලණිය/පෑලියගොඩ අපජල පවිත්‍රාගාරය (පැකේජය 2) සඳහා ලංසු කැඳවීමේ ක්‍රියාවලිය සහ ලංසු ලේඛන සකස් කිරීම මුදල් නොමැතිකම හේතුවෙන් ප්‍රමාද වී තිබුණි. | 2022 දෙසැම්බර් 20 වන විට මීගමුව නිර්මාණ සම්පූර්ණ කිරීමට ඩීඑස්සී (DSC) උපදේශක සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුව එකඟ වූ පරිදි වැඩ අවසන් කරන ලදී. | ව්‍යාපෘති කටයුතු නැවත ආරම්භ කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | මලාපවහන අංශයේ තාක්ෂණික සහාය සහ ධාරිතා වර්ධනය | මලාපවහන කළමනාකරණ නිපුණතා සංවර්ධන උපදේශනය (පැකේජය 1 ,2,3) | 100 | 60 | (i) ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2018 නොවැම්බර් මාසයේදී ආරම්භ කිරීමට නියමිතව තිබුණද, 2022 නොවැම්බර් මාසයේදී උපකරණ කොන්ත්‍රාත්තුව (පැකේජය 2) පමණක් ප්‍රදානය කරන ලද අතර, අනෙකුත් කොන්ත්‍රාත්තු 2023 දෙසැම්බර් 31 වන විට ප්‍රදානය කර නොතිබුණි. | ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තු කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇත. | ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (ඇ) | මීගමුව නගරය සඳහා මලාපවහන යටිතල පහසුකම් පිළිබඳ අධ්‍යයනය සහ ඉදිකිරීම්. | මීගමුව අපජල බැහැර කිරීමේ පද්ධතිය සඳහා පොම්පාගාරයක් සහිත එකතු කිරීමේ පද්ධතියක් ඉදිකිරීම. | 100 | 0 | කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) වෙත ලංසු ලේඛනය ඉදිරිපත් කර 2022 ජනවාරි 25 දින අනුමැතිය ලබා ගත්තද, AFD අරමුදල් සීමා කිරීම් හේතුවෙන් ලංසු කැඳවීම අත්හිටුවා තිබුණි. | මුදල් නොමැතිකම හේතුවෙන් ලංසු කැඳවීමේ කටයුතු අත්හිටුවා ඇත. | ව්‍යාපෘති කටයුතු අවසන් කර ප්‍රතිලාභීන්ගේ අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මීගමුව නගරය සඳහා මලාපවහන යටිතල පහසුකම් පිළිබඳ අධ්‍යයනය සහ ඉදිකිරීම්. | මීගමුව මලාපවහන පද්ධතිය සඳහා අපජල පවිත්‍රාගාරයක් සහ බැහැර කිරීමේ පද්ධතියක් නිර්මාණ කිරීම සහ ඉදි කිරීම. | 100 | 0 | මුදල් නොමැතිකම හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු අත්හිටුවා තිබුණි. | අරමුදල් නොමැතිකම හේතුවෙන් අත්හිටුවා ඇත. | ව්‍යාපෘති කටයුතු අවසන් කර ප්‍රතිලාභීන්ගේ අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතුය |
| (ඊ) | මීගමුව නගරය සඳහා මලාපවහන යටිතල පහසුකම් පිළිබඳ අධ්‍යයනය සහ ඉදිකිරීම්. | මීගමුව මලාපවහන පද්ධතිය සඳහා පටු මාර්ගවල එකතු කිරීමේ ජාලය සහ දේපල සම්බන්ධ කිරීම. . | 100 | 0 | අරමුදල් නොමැතිකම හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු අත්හිටුවා තිබුණි. | අරමුදල් නොමැතිකම හේතුවෙන් අත්හිටුවා ඇත. | ව්‍යාපෘති කටයුතු අවසන් කර ප්‍රතිලාභීන්ගේ අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතුය |
| (උ) | ඉඩම් අත්පත් කර ගැනීම සහ ඉඩම් නිෂ්කාශනය | | 100 | 6 | 2023 දෙසැම්බර් 31 වන විට එම ඉඩම් කට්ටි 33න් ඉඩම් කට්ටි 2ක් පමණක් අත්පත් කරගෙන තිබුණි. | රජයේ වියදම් අඩු කිරීම සඳහා සාමාන්‍ය ක්‍රියාවලිය යටතේ අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු විය. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |

**2.2 ව්‍යාපෘතියේ අරමුණු වලින් පරිබාහිරව සිදු කරන ලද ගෙවීම්**

| ව්‍යාපෘති ක්‍රියාකාරකම | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| මලාපවහන කළමනාකරණ නිපුණතා සංවර්ධන උපදේශනය (පැකේජය 1 ,2,3) | මෙම වියදමට හෝටල් නවාතැන් කුලි, බස් කුලි, මල් සැරසිලි, ප්‍රදර්ශන කුටි, LED තිර සහ විසිතුරු ආලෝකයන් සඳහා වූ වියදම් සඳහා මිලියන 4.3ක් ව්‍යාපෘතියේ අරමුණුවලට පරිබාහිර ක්‍රියාකාරකම් සඳහා වැය කර තිබුණි. | මෙම වියදම් 2022 ජාත්‍යන්තර ජල සම්මන්ත්‍රණයට අදාළ වන අතර, පැකේජ 03 යටතේ ප්‍රදාන අරමුදල හරහා වියදම් දැරීමට ඒජන්සි ෆ්‍රැන්කේස් ඩි ඩිවලොප්මන්ට් වෙතින් කිසිදු විරෝධතාවයක් දක්වා නොමැත. | ව්‍යාපෘති අරමුණුවලින් පරිබාහිර ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපෘති අරමුදල් යෙදවීම හේතුවෙන් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ජල සම්මන්ත්‍රණය සඳහා වන වියදම් රේඛීය අමාත්‍යාංශය විසින් බැර කළ යුතුය. |

**3. මතභේදයට තුඩු දුන් කරුණු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | මෙම ව්‍යාපෘතිය 2016 ජුනි මස ආරම්භ කර 2022 ජුනි වන විට අවසන් කිරීමට නියමිතව තිබූ නමුත් 2024 අවසානය දක්වා තවත් වසර දෙකකින් දීර්ඝ කර තිබුණි.<br>දිනකට මීටර් 16,000 ක ධාරිතාවකින් යුත් අපජල පවිත්‍රාගාරයක් (WWTP), අපජල බැහැර කිරීමේ පද්ධතියක්, කිලෝමීටර 79 ක දිගින් යුත් අපජල එකතු කිරීමේ ජාලයක් සහ සම්බන්ධතා 6000 ක් ලබා දීම ව්‍යාපෘතියේ විෂය පථයට ඇතුළත් වේ. කෙසේ නමුත් ණය ගිවිසුම යටතේ අරමුදල් ලබා දීම අත්හිටුවීම හේතුවෙන් ඉදිකිරීම් සඳහා ප්‍රසම්පාදන කටයුතු 2023 දෙසැම්බර් 31 වන විට අවසන් කර නොතිබුණි. 2023 දෙසැම්බර් 31 වන විට ණය සහ ප්‍රදානය සඳහා ලබා දුන් ප්‍රමාණය පිළිවෙලින් සියයට 3 සහ සියයට 1 ක් වූ අතර, මිලියන 16,898 ක් ලබා දී නොතිබුණි. තවද, 2023 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ නිර්මාණ සහ සැලසුම් අදියර සඳහා රුපියල් මිලියන 1,841 ක මුදලක් වැය කර තිබුණි. | විවිධ හේතු නිසා ව්‍යාපෘතිය ප්‍රමාද විය. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල සැලකිය යුතු ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි ව තිබූ අතර පසුගිය වසර 12 තුළ රටට කිසිදු ආර්ථික වටිනාකමක් ලගා කර ගැනීමෙන් තොරව නොගෙවූ ණය මුදල සඳහා කැපවීමේ ගාස්තු ලෙස රුපියල් මිලියන 464.8 ක් ගෙවීමට රජයට සිදු වී තිබුණි. | ව්‍යාපෘතියේ ප්‍රමාදය හේතුවෙන් මුදල් ලබාදීම ප්‍රමාද විය. | අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීම සඳහා ව්‍යාපෘතිය නැවත ආරම්භ කළ යුතුය. |